## සාරාංශකරණය

සාරාංශය යනු සංක්ෂිප්තකොට ලියා දැක්වීමයි. එනම් හරය හෙවත් සාරය ලියා දැක්වීමයි. සාරාංශ කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි. එනම්,

01 පළමුව ඡේදයේ හරය වැටහෙන තෙක් කීප වරක් කියවීම.
02 දෙවනුව එහි වැදගත් අදහස්වලට යටින් ඉරි අඳින්න. නැතහොත් වෙනම කොළයක ලියා ගන්න.
03 මෙහි දී නිදර්ශන, උපමා, විශේෂණ, අලංකාර, පුනරුක්ති, අනවශ්‍ය නිපාත ආදිය ඉවත් කළ යුතුයි.
04 සකස් කරගත් කොටස් නැවත පිළිවෙළකට ගොනු කරගන්න.
05 සාරාංශය ලියන වචන පිළිබඳ සැළකිලිමත් වන්න.
06 දී ඇති කොටසේ අදහස මැනවින් ඉදිරිපත් වන සේ එක් ඡේදයකට සාරාංශය ලියන්න.
07 ඔබ ලියූ සාරාංශයේ වචන ගණන එය යටින් ලියා දක්වන්න.

<u>අභ්‍යාසය :</u>

01. ඉහත උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් සාරාංශ දී ඇති වචන ප්‍රමාණයෙන් 1/3ක් වන සේ ලියා දක්වන්න. ඔබගේ සෑම සාරාංශයක් අවසානයේ ම එහි වචන ගණන ලියා දක්වන්න.

I. බස දන්නා සියලු දෙනාට රස වින්දනයේ ශක්‍යතාව තිබෙන නමුත් නිර්මාණ විෂයෙහි මෙන් වින්දන විෂයෙහි ද පරිචය ඇත්නම් මැනවි. බස දැනීම වූ කලී එක් එක් කෙනා තුළ එක් එක් ප්‍රමාණයට පිහිටා තිබිය හැක්කකි. යන්තම් වචනාර්ථය තේරුම් ගැනීම ද බස දැනීමක් වේ. එහෙත් බස සම්පූර්ණයෙන් දැන ගැනීමට නම් බස් වහරේ විවිධාර්ථ වටහා ගත මනා ය. මතු පිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංග්‍යාර්ථය ද අවබෝධ කළ යුතු ය. මෙසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නොව හෘදයගෝචර වන කොටස ද දත යුතු ය.

රස වින්දනයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රස වින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුම ද වර්ධනය වේ. මක් නිසා ද යත් බස ඉතා සූක්ෂම ලෙස සාධාරණය කරන්නේ කවීන් වන බැවිනි. කවියා භාෂාවේ ඇති මුළු ශක්‍යතාවෙන් ප්‍රයෝජන ගන්නා කෙනෙකි. පිසමන් දන්නා අරක්කැමියා නොයෙක් ද්‍රව්‍ය ගෙන නොයෙක් අයුරින් මිශ්‍ර කොට අපූරු රසයෙන් යුත් ආහාර පිසින්නා සේ ම කවියා ද නොයෙක් වචන ගෙන, නොයෙක් අරුත් ගෙන, විවිධ ලෙස මිශ්‍ර කොට, පෙර නොවූ විරූ ව්‍යංග්‍යාර්ථ ශබ්ද ධ්වනි ඇති කොට අපූරු රසයක් නිර්මාණය කරයි.

II. ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන විරුදාවලිය ලත් ශ්‍රී ලංකාවේ දේශගුණය තේ, රබර්, පොල් වැනි වාණිජ බෝග සඳහා වඩාත් යෝග්‍ය යැයි පිළිගෙන ඇත. ප්‍රමාණවත් වර්ෂාපතනයක් කුඹුරුවලට හරවා ගත හැකි ගංගා හා වැව් ජලය නිසා අපේ රටේ කුඹුරු ගොවිතැන සරුවට කෙරේ. උස් බිම්වල මෙන් ම ඇතැම් පහත් බිම්වල ද තේ පැළය සරුවට වැවෙතත් වැඩි ඉල්ලුමක් ඇත්තේ උස් බිම්වල වැවෙන තේවලටයි. භූමියේ උස ප්‍රමාණය අනුව තේවල රසය ද උස් පහත් වීම ඊට හේතුවයි. ලංකාවේ පහත් බිම්වලින් වැඩි හරියක් පොල් ගසේ සෙවණ ලබයි. වන රොදින් හා තෙත් පඳුරුවලින් අලංකෘත උස්බිම්වලින් සමන්විත ශ්‍රී ලංකාව රමණීය දිවයිනකි.

III. පෝෂ්‍යදායක ආහාර ප්‍රමාණවත් අන්දමින් ශරීරයට ලැබුණු විට මොළය හොඳින් ක්‍රියා කරතැයි ප්‍රකාශ කරන විද්‍යාඥයෝ එකම ප්‍රශ්නය ගැන දිගින් දිගටම කල්පනා කිරීමෙන් මොළයේ තීක්ෂණභාවය අඩුවෙතැයි ද පවසති. කය වෙහෙසා වැඩ කරන්නන් පෑනෙන් වැඩ කරන්නන් තරම් බුද්ධි බලයක් නැති පිරිසක් ලෙස සැළකීම ගතානුගතික පළපුරුද්දක් වුවත් එය ප්‍රතිෂ්ඨා විරහිතය. කය හෙහෙසා වැඩ කරන්නන්ගේ බුද්ධිය ක්‍රමයෙන් දියුණු වන බව ද ඇතැම් කම්කරුවන්ගේ බුද්ධි බලය උගතුන් සේ වැජඹෙන සමහරුන්ගේ බුද්ධි බලයට වඩා වැඩි බව ද විද්‍යාඥයෝ ප්‍රකාශ කරති.

02. පහත සඳහන් ඡේදය කියවා වචන 50-60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කර දක්වන්න. ඔබේ උත්තරයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියා දක්වන්න.

ලෝකයේ දක්නට ලැබෙන දාර්ශනික හා සාහිත්‍යමය වටිනාකමකින් යුත් පැරණිම ලේඛන වන වේද ග්‍රන්ථ, රාමායනය, මහාභාරත පමණක් නොව ඉලියට් හා ඔඩිසි යන මහා කාව්‍ය පවා ලියන ලද්දේ ඒ ඒ භාෂාවන්හි ව්‍යාකරණ හදාරා ඒ නීතිරීති අනුව නොවේ. ඒවා රචනා වූ කාලය වන විට භාෂාවේ භාවිතය පිළිබඳ එක්තරා සාම්ප්‍රදායික නීතිරීති මාලාවක් ඒ උගතුන්ගේ සිත්වල අවිඥානකව පවතින්නට ඇත. එසේම ඒවායින් පිට පැන ගිය අවස්ථා ද තිබෙන්නට ඇත. භාෂාවක් පවතින්නේ සාම්ප්‍රදායික නීතිරීතිවලට අනුකූල වූ විට ය. ඒ භාෂාවම දියුණු වන්නේ ඒ නීතිරීතිවලින් පිට පනින විට ය. මෙය පරස්පර විරෝධී කියමනක් නොවේ. එකම මාර්ගයේ හැමදාම ගමන් කිරීමෙන් අලුත් දේවල් දැන සොයා ගත නොහැකි ය. යම් හෙයකින් මේ පිට පැනීම සීමාව ඉක්මවා ගිය හොත් එවිට මංමුලා වීමට පවා ඉඩ තිබේ. ඇත්ත වශයෙන් ලොවට නව දැනුමක් ලබා දෙන නිර්මාණාත්මක ලේඛකයන් විසින් අද වුව ද භාෂාව භාවිත කළ යුත්තේ මේ අන්දමිනි. ගතානුගතික දැනුම හා අදහස් ඉදිරිපත් කරන ලේඛකයන්ට නම් සාම්ප්‍රදායික ව්‍යාකරණ නීතිරීති හදාරා සිය සීමා සහිත දැනුම ඒ රාමුව ඇතුළත ඉදිරිපත් කළ හැකි ය. අලුත් දෙයක් ලොවට දෙන ලේඛකයා තුළ සාම්ප්‍රදායික ව්‍යාකරණ ඥානය ශික්ෂණයක් හැටියට චිත්ත චෛතසිකගතව පවතින නමුත් එයට ඔහුගේ නිදහස් ප්‍රකාශනය පාලනය කිරීමට ඉඩ නොතැබිය යුතු ය. සිරගතවීම යන දෙකෙන් ම තොර ව ඉදිරියට යා හැක්කේ එකල්හි ය.